// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2296/37 - 2022 සැප්තැම්බර් මස 09 වැනි සිකුරාදා - 2022.09.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත**

නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9අ වගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම, 1987 මැයි 12 වන දින අංක 453/20 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයකින් සංස්ථාපනය කරන ලද ත්‍රිකුණාමලය නගරය සහ කඩවත් සතර ප්‍රාදේශීය සභාව, සීමා මායිම් සංශෝධනය සහ සභික සංඛ්‍යාව සංශෝධනය කර නව ප්‍රාදේශීය සභාවක් මගින් ඒ ප්‍රාදේශීය සභාව පුනස්ථාපනය කිරීම සඳහා 2023 මාර්තු මස 19 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විසුරුවා හරිමි.

**දිනේෂ් ගුණවර්ධන,**
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 05 වන දින,
කොළඹ දී ය.

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත**

***නියමය***

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන්, 4 වන වගන්තියෙන්, 6 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම, මෙම නියමයෙන් -

1. මෙහි උපලේඛනයේ I වැනි කොටසේ නිරූපිත ප්‍රදේශය එම පනතේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් විය යුතු යැයි ප්‍රකාශ කරමි.

2. එම උපලේඛනයේ II වැනි කොටසේ දක්වා ඇති සීමා, එම ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පරිපාලන සීමා ලෙස නියම කරමි.

3. මෙම නියමයේ (1) වැනි ඡේදය යටතේ ප්‍රකාශිත ප්‍රාදේශීය සභා ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කර, එම ප්‍රාදේශීය සභාවට පහත සඳහන් නාමය පවරමි.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

"ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය සභාව"

4. ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය සභාව.

   i. ප්‍රාදේශීය සභා පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) වන ඡේදය යටතේ තෝරා පත්කර ගත යුතු සභිකයන් එකලොස් දෙනෙකුගෙන් ද,

   ii. ප්‍රාදේශීය සභා පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ තෝරා යැවිය යුතු සභිකයන් හත් දෙනෙකුගෙන් ද,

   iii. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 65ආ වගන්තියේ (4) වන උප වගන්තියේ (අ) ඡේදය යටතේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන සභික සංඛ්‍යාවකින්ද

සමන්විත විය යුතු යැයි නියම කරමි.

5. ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය සභාවේ ධූර කාලය ආරම්භ කළ යුතු දිනය 2023 මාර්තු මස 20 වැනි දිනය වශයෙන් නියම කරමි.

**දිනේෂ් ගුණවර්ධන,**
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 05 වන දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

*I කොටස*

පහත සඳහන් ග්‍රාම නිලධාරී වසම්වලින් සමන්විත භූමි ප්‍රදේශය :-

සාම්පල්තීවු (242), සල්ලි (242-A), ඉලුප්පෛකුලම් (242-B), උප්පුවේලි (243), පුලියන්කුලම් (243-L), ආන්දම්කුලම (243-A), මාන්ගායුත්තු (243-K), පීලියඩි (243-J) කන්නියා (243-B), විල්ගම (243-E), වෙල්වේරි (243-Q), වරෝතයනගර් (243-N), සුමේධංකරපුර (229-B), මුත්තුනගර් (229-F), කල්පල්තුරෙ (229-E), කාවඩ්ඩිකුඩ (229-D), නාච්චිකුඩ (229-C), වෙල්ලමනල් (229), සෙල්වනාහපුර (229-M), මිහිඳුපුර (229-I), අන්පුවාලිපුරම් (243-C), චීනවරාය (229-A)

*II වන කොටස*

ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා :-

*උතුරට* : අනුරාධපුර-ත්‍රිකුණාමල පාරේ කිලෝමීටර් 104 කණුවේ සිට ඇළ දක්වා කට්කාටුකුලම් කුඹුරු යාය දක්වා කරත්ත පාර දිගේ ඊසාන දිගට, උතුර දෙසට සහ යලි ඊසාන දිගට, කණ්ඩාල්කඩ්ඩු - පෙරියකුලම් පාර හමුවනතෙක් (පෙරියකුලම් වැවේ සිට කිලෝමීටර් එකක් පමණ). ඉන් පසුව පෙරියකුලම් වැවේ සහ පොක්කාන් කුලම් වැවේ පූර්ණ ධාරිතා මට්ටම් රේඛාව හරහා නිරිත දෙසට සහ දකුණු දෙසට සහ ඇතුළු වටරවුම් මාර්ගය හමුවන ස්ථානය දක්වා (ත්‍රිකුණාමලය පුල්මුඩේ මාර්ගයේ සිට කිලෝමීටර් 2[1]2[1] පමණ) අභ්‍යන්තර ත්‍රිකුණාමලය පුල්මුඩෙයි පාර දක්වා ඇතුළු වටරවුම් පාර දිගේ ඊසාන දිගට, වයඹ දිගට සහ යලි ඊසාන දෙසට කිලෝමීටර් හයේ කණුව හන්දිය හමුවන ස්ථානය දක්වා (හයේ කණුව යනුවෙන් හඳුන්වන තැන). ඉන් පසු ඉන්දියන් සාගර වෙරළ හමුවන තෙක් කෝනේසපුර පාරේ මධ්‍ය රේඛාව දිගේ (නැගෙනහිර විශ්වවිද්‍යාල පාර) ඊසාන දෙසට සහ නැගෙනහිර දෙසට.

*නැගෙනහිරට* : ත්‍රිකුණාමලය පුල්මුඩෙයි පාරේ කිලෝමීටර් තුන කණුව (තුනේ කණුව යනුවෙන් හඳුන්වනු ලබන) හරහා දිවෙන වලර්මතී මාවතේ මධ්‍ය රේඛාව හමුවන තුරු සමුදුරු වෙරළ දිගේ අවසන් වරට දක්වන ලද ලක්ෂයේ සිට දකුණු සහ නිරිත දෙසට. ඉන් පසු අභිමත රේඛාවක් දිගේ අන්පුවාලිපුරම් හිඳී පල්ලියාර් කෝවිල් පාර හමුවන තුරු දකුණු දෙසට සහ නිරිත දෙසට (ත්‍රිකුණාමල නුවර පාරේ කිලෝමීටර් 0.3 පමණ කිලෝමීටර් 158 කණුව ආසන්නයට) ඉන්පසු දුම්රිය හරහා පාර හමුවන තෙක් (සිමෙන්ති කම්හලේ පිවිසුම ආසන්නයේ) ත්‍රිකුණාමල - මඩකලපුව පාර දිගේ ත්‍රිකුණාමල - නුවර පාරේ මධ්‍ය රේඛාව දිගේ බටහිර දෙසට, සහ නිරිත දෙසට සහ ගිණිකොන දෙසට (කිලෝමීටර් 156 කණුව හන්දිය හතරේ කණුව යනුවෙන් හඳුන්වනු ලබන). මඩ බොක්ක (Mud Cover) හිඳී සමුදුරු වෙරළ හමුවන තෙක්

දුම්රිය හරහා පාරේ සිට (දුම්රිය හරහා පාරේ සිට කිලෝමීටර් 0.72 පමණ) දුම්රිය පාර දිගේ ඊසාන දෙසට සහ ගිණිකොන දෙසට. ඉන් පසු මාබල් වෙරළ දක්වා සමුදුරු වෙරළ දිගේ දකුණු දෙසට, බටහිර දෙසට, නිරිත දෙසට, නැගෙනහිර දෙසට, ඊසාන දෙසට, බටහිර දෙසට නිරිත දෙසට මඩ බොක්ක (Mud Cove), උතුරු බොක්ක (North Core), කඩොලාන බොක්ක (Mangrove Cove), කොඩ් බොක්ක (Cod bay), චීන වරාය (China Bay), මැලේ බොක්ක (Malay Cove), ස්න්ග් බොක්ක (Snug Cove), ක්ලැපන්බර්ග් බොක්ක (Clappenburg Cove), ඩෙඩ්මන් බොක්ක (Deadman Cove), කාරි මලෙයි ඔට්ටු, පෙරියමලෙයිකුඩා, මාර්බල් වෙරළ.

*දකුණට* : අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට සමුදුරු වෙරළ දිගේ බටහිර දෙසට, නිරිත දෙසට, දකුණු දෙසට, නිරිත දෙසට, දකුණ දෙසට සහ යලි නිරිත දෙසට සහ කිණ්නියා පාලම සහ තම්පලාගාමම් බොක්ක හරහා පාලම්පොට්ට නදියේ මධ්‍ය රේඛාව තම්පලාගාමම් බොක්ක වෙත වැටෙනා ස්ථානය දක්වා (කින්නියා තොටුපොළ සහ තම්පලාගාමම් බොක්ක)

*බටහිරට* : අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට හබරණ ත්‍රිකුණාමල පාරේ පාලම්පොට්ට නදියේ පාලම් මධ්‍ය රේඛාව දිගේ වයඹ දෙසට. ඉන් පසු ප්‍රදේශයේ උතුර සීමාව ආරම්භවන ස්ථානය දක්වා එනම් කිලෝමීටර් 104 කණුව දක්වා කිලෝ මීටර් 9.6 ක පමණ දුරක් දක්වා අභිමත රේඛාවක් (arbitrary line) දිගේ ඊසාන දෙසට.

EOG 09-0080/1

---

**නගර සභා ආඥාපනත**

නියමය

(255 වැනි අධිකාරය වූ) නගර සභා ආඥා පනතේ 14 වන වගන්තියේ (ඇ) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම, 1978 අගෝස්තු 10 වන දින අංක 329/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන නියමයකින් සංස්ථාපනය කරන ලද ත්‍රිකුණාමලය නගර සභාව, ත්‍රිකුණාමලය මහා නගර සභාව සංස්ථාපනය කිරීම සඳහා 2023 මාර්තු මස 19 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විසුරුවා හරිමි.

**දිනේෂ් ගුණවර්ධන,**
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 05 වන දින,
කොළඹ දී ය.

**මහා නගර සභා ආඥාපනත**

***නියමය***

(252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥා පනතේ 2, 3, 5 සහ 9 වෙනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම, මෙම නියමයෙන් -

1. මෙහි උපලේඛනයේ I වැනි කොටසේ නිරූපිත ප්‍රදේශය එම ආඥාපනතේ කාර්යය සඳහා මහා නගරයක් විය යුතු යැයි ප්‍රකාශ කරමි.
2. එම උපලේඛනයේ II වැනි කොටසේ දක්වා ඇති සීමා, එම මහා නගරයේ පරිපාලන සීමා ලෙස නිශ්චය කරමි.
3. මෙම නියමයේ (1) වැනි ඡේදය යටතේ ප්‍රකාශයට පත් කරන ලද මහා නගරය සඳහා මහා නගර සභාවක් සංස්ථාපනය කර, එම මහා නගර සභාවට පහත සඳහන් නාමය සහ නිල නාමය පවරමි.

**"ත්‍රිකුණාමලය මහා නගර සභාව"**

4. ත්‍රිකුණාමලය මහා නගර සභාව නගරාධිපතිවරයෙකු, නියෝජ්‍ය නගරාධිපතිවරයෙකු ඇතුළු පහත දැක්වෙන I, II සහ III වන ඡේද ප්‍රකාර, තෝරා පත් කරගනු ලබන සහ තෝරා යවනු ලබන සභික සංඛ්‍යාවකින් සමන්විත විය යුතු යැයි නියම කරමි.

   i. (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥා පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාර තෝරා පත්කර ගත යුතු සභිකයන් පහළොස් දෙනෙකුගෙන්ද,

ii. (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥා පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ප්‍රකාර තෝරා යැවිය යුතු සභිකයින් දස දෙනෙකුගෙන්ද,

iii. (252 වන අධිකාරය වූ) මහා නගර සභා ආඥා පනතේ 5 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාර (262 අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 65ආ වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන සභික සංඛ්‍යාවකින්ද;

සමන්විත විය යුතුය.

5. මෙම මහා නගර සභාවේ සභිකයින්ගේ ධූර කාලය ආරම්භ කළ යුතු දිනය 2023 මාර්තු මස 20 වැනි දිනය වශයෙන් නියම කරමි.

**දිනේෂ් ගුණවර්ධන,**
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 05 වන දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

*I කොටස*

පහත සඳහන් ග්‍රාම නිලධාරී වසම්වලින් සමන්විත භූමි ප්‍රදේශය :-

මනයාවෙලි (244-F), විල්ලූන්ඩි (244-E), අරුනගිරිනගර් (244-G), සෝනගවාඩි (244-I), තිල්ලයි නගර් (244-H), අරසාඩි (244-J), පට්ටනතේරු (244-K), පෙරුනරුන්තේරු (244-L), සවපුරි (244-Q), ඔර්ස්හිල් (244-P), තිරුකඩලූර් (243-F), මුරුගාපුරි (243-G), ජින්නානගර් (244-O), අභයපුර (244-N), ලිංගනගර් (244-R), මඩ්කෝ (244-M), පාලයියූත්තු (243-D), පුන්පුහාර් (243-O), කෝවිල්අඩි (243-P), සිංපුර (243-H)

*II කොටස*

ත්‍රිකුණාමලය මහා නගර සභාවේ පරිපාලන සීමා :

*උතුරට* : ත්‍රිකුණාමලය හබරණ පාරේ කිලෝමීටර් 156 කණුව වන කිලෝමීටර් 156 කණුව හන්දියේ සිට (හතරේ කණුව යනුවෙන් හඳුන්වනු ලබන) අන්පුවාලිපුරම් හිදී පල්ලියාර් කෝවිල් වෙත ත්‍රිකුණාමලය හබරණ පාරේ මධ්‍ය රේඛාව දිගේ ඊසාන දෙසට, නිරිත දෙසට, යලි ඊසාන දෙසට, උතුරු දෙසට සහ පල්ලියාර් කෝවිල් පාර දිගට (ත්‍රිකුණාමලය - නුවර පාරේ සිට කිලෝමීටර් 0.3 ක් පමණ දුරින් 158 කිලෝමීටර් කණුව ආසන්නයේ) ඉන් පසු ලව් ලේන් හමුවන තුරු අභිමත රේඛාවක් දිගේ ඊසාන දෙසට, උතුර දෙසට, නිරිත දෙසට, ඊසාන දෙසට, සහ නැගෙනහිර දෙසට ද 3 වන කිලෝමීටර් කණුව (තුනේ කණුව නමින් හඳුන්වන ලබන) හරහා. ඉන්පසු වලර්මතී මාවත හන්දිය හමුවන තුරු එහාම්පරම් පාර දිගේ (කිලෝමීටර් 3 කණුවේ සිට තුනේ කණුව නමින් හඳුන්වනු ලබන) සහ ඉන්පසු වලර්මතී මධ්‍ය රේඛාව ඔස්සේ ඉන්දියානු සාගරයේ වෙරළ දක්වා.

*නැගෙනහිරට* : නාවික හමුදාවේ එලිපන්ට් පොයින්ට් වෙරළ හමුවන තැන දක්වා අවසන් වරට සඳහන් ස්ථානය සිට ඉන්දියානු සාගර වෙරළ දිගේ දකුණු දෙසට, නිරිත දෙසට, ඊසාන දෙසට, නිරිත දෙසට, බටහිර දෙසට, දකුණු දෙසට, කළු බොක්ක (Black Bay), තිරුකෝනේෂ්වරන් කෝවිල්, අංගනය (Edge), ලන්දේසි බොක්ක, (Dutch Bay), වැලි බොක්ක වෙරළ (Sandy Bay Beach) කොල බොක්ක වෙරළ (Green Bay Beach) සහ එලිපන්ට් තුඩුව (Elephant Point Beach)

*දකුණට* : අවසන් වරට සඳහන් ස්ථානයේ සිට මුහුදු වෙරළ දිගේ අභිමත රේඛාවක් දිගේ දුම්රිය පාර දක්වා (සිමෙන්ති කම්හල අසල දක්වා ඇති ස්ථානයක්) නැගෙනහිර දෙසට, ඊසාන දෙසට, නිරිත දෙසට, ඊසාන දෙසට, වයඹ දෙසට, ගිණිකොණ දෙසට සහ යලි ඊසාන දෙසට, වයඹ දෙසට, නිරිත දෙසට යලි වයඹ දෙසට (Nicholson Cove, Inner Harbour, Powder Bay, Yard Cove, Mud Cove, North Cove) උතුරු දෙසට, වයඹ දෙසට, නිරිත දෙසට සහ දුම්රිය පාර දිගේ ත්‍රිකුණාමලය - මඩකලපුව පාරේ දුම්රිය හරහා පාර දක්වා

*බටහිරට* : අවසන් වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට 156 කිලෝමීටර් කණුව හමුවන තුරු ත්‍රිකුණාමලය - මඩකලපුව පාරේ මධ්‍ය රේඛාව දිගේ වයඹ දෙසට, ඊසාන දෙසට සහ ත්‍රිකුණාමලය - හබරණ පාරේ මධ්‍ය ලක්ෂය දිගේ.

EOG 09-0080/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.